221

# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික සිරිත් විරිත්, අභිචාර ක්‍රම සහ වර්තමාන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ඒවායේ දායකත්වය

(නුවරකලාවිය ප්‍රදේශයට අයත් මානන්කට්ටිය ගම ආශ්‍රිත අධ්‍යයනයකි)


ඩී.එම්.උබේසේකර

SOCI/M/03R/97


කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2000 නොවැම්බර්


සමාජ විද්‍යා අධ්‍යනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

## 1.5 නිබන්ධ සාරාංශය

ශ්‍රී ලංකාවෙ සාම්ප්‍රදායික කෘෂිකර්මය හා සම්බන්ධ අභිචාර සිරිත් විරිත් හා වර්තමානයේ ඒවායෙහි භාවිතය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ඒ අනුව සිදුකළ තොරතුරු ගවේෂණය ඇසුරින් ලියන ලද පහත පරිච්ඡේද වලදී සැලකිල්ලට ගත් කරුණු හා විශ්ලේෂණය කළ තොරතුරු පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

මෙහි එන පළමුවන පරිච්ඡේදයේ දී මාගේ පර්යේෂණ මාතෘකාවේ පසුබිම පිළිබඳවත් එහි අන්තර්ගත සමාජ විද්‍යාත්මක හා සමාජ මානව විද්‍යාත්මක වැදගත්කම පිළිබඳවත් කෙටි හැඳින්වීමක් ඇතුළත් වේ. එමෙන්ම පර්යේෂණයේ දී මා අරමුණු කරගත් ප්‍රධාන අංශ, පර්යේෂණයේ දත්ත රැස් කිරීමට යොදාගත් ක්ෂේත්‍රය හා දත්ත රැස්කිරීමට භාවිතා කළ ක්‍රමවේදයන් පිළිබඳව පළමු පරිච්ඡේදය තුළ කෙටි පැහැදිලි කිරීමක් ඇතුළත් වෙයි. මෙම කරුණුවලට අමතරව මගේ පර්යේෂණයේ මාතෘකාව, ක්ෂේත්‍රය හා දත්ත රැස්කිරීමේදී සැලකිල්ලට ගත් සීමාවන් ද මෙම පරිච්ඡේදය තුළ දක්වා තිබේ..

පර්යේෂණයේ දෙවන පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම වෙන් වී තිබෙන්නේ කෘෂිකර්මය පිළිබඳව මූලාශ්‍රගත තොරතුරු ආශ්‍රිත විග්‍රහයක් කිරීමටය. එහිදී කෘෂිකර්මය යන්න අර්ථ නිරූපණය කිරීමටත් ලෝක කෘෂිකාර්මික ඉතිහාසය හා ආරම්භය ගැන කෙටියෙන් විමසා බැලීමටත් උත්සාහ කළෙමි. සාම්ප්‍රදායික කෘෂිකර්මය යනු කුමක් දැයි විග්‍රහ කර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මයේ ස්වභාවය හා එහි ඉතිහාසය පිළිබඳව තරමක විස්තරාත්මක විග්‍රහයක් මේ තුළ ඇතුළත් වෙයි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය පිළිබඳ මෙම විග්‍රහයේ දී ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වී ගොවිතැන හා හේන් ගොවිතැන පිළිබඳවත් එම වගා කටයුතු සිදුකළ ආකාරය පිළිබඳවත් විවිධ මූලාශ්‍ර උපයෝගී කරගනිමින් කරුණු සාකච්ඡා කර තිබේ.

මීළඟ පරිච්ඡේදය වන තෙවැනි පරිච්ඡේදයේදී මා උත්සාහ කළේ අභිචාර පිළිබඳව මූලාශ්‍රගත තොරතුරු ඇසුරින් සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක් කිරීමටයි. එහිදී අභිචාර යන්න අර්ථ නිරූපණය කිරීමටත් අභිචාර හා ප්‍රාථමික ආගම අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කිරීමට උත්සාහ කළෙමි. අනතුරුව අභිචාර පිළිබඳව ලෝකයේ ප්‍රකට සමාජ හා මානව විද්‍යාඥයින් ඉදිරිපත් කළ විවිධ වර්ගීකරණ පිළිබඳව විමර්ශනයක් මෙහි ඇතුලත් වේ. එම අභිචාර පිළිබඳ වර්ගීකරණ වලින් මගේ පර්යේෂණ අරමුණට අනුකූලවන ලෙස නිෂ්පාදන අභිචාර වෙන් කොට ගනිමින් එම අභිචාර විශේෂය පිළිබඳ වෙනම විමර්ශනයක් ද මෙහි ඇතුලත් වේ. ඉන් පසුව පොදුවේ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ප්‍රදේශවල භාවිතා වන කෘෂිකාර්මික වගා ක්‍රම හා එහිදී යොදාගැනෙන විවිධ වූ අභිචාර සිරිත් විරිත් හා උත්සව පිළිබඳව විමර්ශනයක් ද මෙහි ඇතුලත් වේ. ඒ මගින් ශ්‍රී ලාංකික ගැමි සංස්කෘතිය හා එහි සාම්ප්‍රදායික මුහුණුවර පිළිබඳව සමාජ මානව විද්‍යාත්මක චිත්‍රයක් ගෙනහැර පෑමටත් උත්සාහ කළෙමි.

මෙහි එන හතරවැනි පරිච්ඡේදය තුළ මාගේ ක්ෂේත්‍ර අධ්‍යයනය ආශ්‍රිත තොරතුරු විශ්ලේෂණය කෙරේ. මානන්කට්ටිය ගම තුළින් ලබාගත් තොරතුරු එහි විග්‍රහ වේ. ගම පිළිබඳ හැඳින්වීම ඓතිහාසික පසුබිම සමාජ ව්‍යුහය හා සංවිධානයේ අතීත හා වර්තමාන මුහුණුවර මේ තුළ සාකච්ඡා කෙරේ. එමෙන්ම ගමේ කෘෂිකාර්මික ක්‍රියාවලිය සාම්ප්‍රදායිකව පවත්වාගෙන ගිය අන්දම භාවිතා කළ සිරිත් විරිත් අභිචාර හා ගම තුළ පැවැත්වූ මුට්ටි නැමීමේ මංගල්‍යය, කිරි ඉතිරවීම වැනි උත්සව පිළිබඳවත් මෙහි විග්‍රහ කෙරේ. ඊට අමතරව වර්තමාන මානන්කට්ටිය ගමේ කෘෂිකාර්මික සංවිධානය ගැන කරුණු විග්‍රහ කරන අතර එහිදී සාම්ප්‍රදායික කෘෂිකර්මය නවීකරණය වීමට බලපෑ සාධක හා එමගින් ගම තුළ ගොඩනැගී ඇති කෘෂිකාර්මික ශිල්ප ක්‍රම සිරිත් විරිත් ආකල්ප හා ඒවායෙහි සමාජීය බලපෑම ගැන ද ක්ෂේත්‍රගත තොරතුරු ආශ්‍රිතව මෙහි දත්ත විශ්ලේෂණය කර තිබේ.

පර්යේෂණයේ පස්වෙනි පරිච්ඡේදයේ සාකච්ඡා කෙරෙන්නේ නවීකරණය කෘෂිකර්මය

කෙරේ බලපා ඇති අන්දම පිළිබඳවයි. මෙහි කෘෂිකර්මය හා නවීකරණය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳවත් එහිලා ලෝකයේ ප්‍රචලිත සංකල්පයක් වූ හරිත විප්ලවය පිළිබඳවත් ගැඹුරින් කරුණු සාකච්ඡා කෙරේ. ඉන් පසුව මෙම පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නවීකණය වී ඇති ආකාරයත් එහිලා හරිත විප්ලවයේ බලපෑම පිළිබඳවත් කෘෂිකාර්මික සංවර්ධනය හා නවීකරණය අරමුණු කරගෙන ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් හා අණපනත් හා ප්‍රතිපත්ති පිළිබඳවත් මෙහි විස්තර කෙරේ. මෙම පරිච්ඡේදයේ දී ඉහත මාතෘකා පිළිබඳව අදාල කරුණු විවරණය කළේ හුදෙක් මූලාශ්‍රගත තොරතුරු ඇසුරිනි. එහෙත් මෙම පරිච්ඡේදයේ අවසන් මාතෘකාව වන "ශ්‍රී ලංකාවේ වර්තමාන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය හා එහි ගතිලක්ෂණ" නම් මාතෘකාව තුළ මූලාශ්‍ර ගත තොරතුරු හා මගේ ක්ෂේත්‍ර අධ්‍යයනයට ලක් වූ මානන්කට්ටිය ගම තුළින් හඳුනාගත හැකි වූ වර්තමාන ලක්ෂණ ද සන්සන්දනාත්මකව ගෙන විශ්ලේෂණය කිරීමට උත්සාහ ගතිමි. ඒ තුළ ග්‍රාමීය නායකත්වය, ඉඩම් භුක්තිය, කෘෂිකාර්මික උපකරණ හා ශිල්ප ක්‍රමවල නවීකරණය, නිෂ්පාදන ක්‍රියාමාර්ග හා නිෂ්පාදන සම්බන්ධතා නවීකරණය වීම හා කෘෂිකාර්මික සිරිත් විරිත්වල සිදුවූ නවීකරණය පිළිබඳව පස්වන පරිච්ඡේදයේ දී අවධානය යොමු විය.

මෙම නිබන්ධනයේ හයවැනි පරිච්ඡේදය වෙන් වී තිබෙන්නේ සමස්ත පර්යේෂණය පිළිබඳ සංක්ෂිප්ත වූ සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට හා ඒ ඇසුරින් එළඹෙන ලද නිගමනයන් ඉදිරිපත් කිරීම සඳහා ය.